Abstract No: HSS 32 Humanities, and Social Sciences

# මාධ්‍ය ආචාරධර්ම තුළ ඇති පෞද්ගලිකත්වයේ අයිතිය ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකා නීති පද්ධතියේ ඇති දායකත්වය පිළිබඳ විමසුමක්

**එල්. ජී. එස්. යූ. සඳරුවන්[1*]**

[1]නීති අධ්‍යනංශය, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

විසි වන සියවසයේ කතාබහට ලක්වූ ප්‍රධාන විෂය ධාරාවක් ලෙස ජනමාධ්‍ය හැඳින්විය හැක. ලෝකයේ ඕනෑම වෘත්තියකට අදාළව පවතින  නිශ්චිත ආචාරධර්ම මාලාවක් ඇත. ඒ අනුව මෙම ජනමාධ්‍ය වෘත්තිය ද ආචාරධර්ම මාලාවකින් සමන්විත වේ. ආචාරධර්ම යනු ප්‍රකාශන ක්‍රියාවලිය තුළ නියැළෙන පුද්ගලයන් විසින් ගොඩනගා ගන්නා ලද වාරණ සමූහයකි. මෙය රටින් රටට වෙනස් වේ. පෞද්ගලිකත්වයේ අයිතිය යනු සරලවම යමෙකුට ඔවුන්ගේ පෞද්ගලික කරුණු සහ සබඳතා රහසිගතව තබා ගැනීමට ඇති අයිතියයි. මාධ්‍යකරණයේ යෙදෙන විට හා මාධ්‍යකරණය සඳහා තොරතුරු හඹා යන විට මෙම පෞද්ගලිකත්වයේ අයිතිය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළ යුතුය. මෙම පර්යේෂණයේ, පර්යේෂණ ගැටලුව ලෙස මාධ්‍ය ආචාරධර්ම තුළ පෞද්ගලිකත්වයේ අයිතිය ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකා නීති පද්ධතියේ  දායකත්වයක් තිබේද යන්න විමර්ශනය කෙරේ. මාධ්‍ය ආචාරධර්ම තුළ ඇති පෞද්ගලිකත්වයේ අයිතිය ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකා නීතියේ ඇති දායකත්වය අධ්‍යයනය කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ. මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික දත්ත, ද්වීතීක දත්ත හා තෘතීය දත්ත ද භාවිතා කෙරුණි. ප්‍රාථමික දත්ත සපයා ගැනීමේදී අදාළ ව්‍යවස්ථා ප්‍රතිපාදන පරිශීලනයෙන් හා සම්මුඛ සාකච්ඡා මාර්ගයෙන් තොරතුරු සපයා ගත් අතර, ද්වීතීක දත්ත ලබාගැනීමේ දී දේශීය ග්‍රන්ථ හා වාර සඟරා පරිශීලනය කරන ලදී. තෘතීක දත්ත සපයා ගැනීමේදී මූලික වශයෙන් අන්තර්ජාලය හා පුවත්පත් භාවිත කෙරුණි. මේ සඳහා යෝජිත පර්යේෂණ ක්‍රමවේදය ලෙස මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය යොදා ගැනුණි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ සම්මුඛ සාකච්ඡා මඟින් තොරතුරු එක්රැස් කරගැනීම සඳහා නීතිය පිළිබඳව පර්යේෂණය කරන ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරුන් දෙදෙනෙකු සමඟ සාකච්ඡා කෙරුණු අතර, ප්‍රමාණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ මාධ්‍ය ක්ෂේත්‍රයේ සේවය කරන නීති වෘත්තිකයන් පස් දෙනෙකු හා මාධ්‍යවේදීන් පස් දෙනෙකු තෝරාගෙන ඔවුන්ට ප්‍රශ්න මාලාවක් ලබාදී ප්‍රමාණාත්මක දත්ත එක්රැස් කර ගැනුණි. පෞද්ගලිකත්වයේ අයිතිය ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකාව තුළ නිශ්චිත නීති පද්ධතියක් ඇති බව මෙම අධ්‍යයනයේ දී සොයා ගැනුණි. එමෙන්ම මාධ්‍ය ආචාරධර්ම තුළ පෞද්ගලිකත්වයේ අයිතිය ආරක්ෂා කිරීමට ජාත්‍යන්තර සම්මුතීන්ට පවා ශ්‍රී ලංකාව බැඳී සිටින බව මෙම අධ්‍යයනයේ දී හෙළිවිය. මෙම අධ්‍යයනය මගින් දැනට පවතින නීති තත්වය මූලික වශයෙන් අධ්‍යයනය කෙරුණු අතර, පවතින නීතිවල හිඩැස් පිරවීම සඳහා යෝජනා හා නිර්දේශ මෙම අධ්‍යයනය මගින් සපයා ඇත.

**මුඛ්‍ය පද :** ආචාරධර්ම, ජනමාධ්‍ය, නීතිය, පෞද්ගලිකත්වයේ අයිතිය, වෘත්තිය

* uthpalasahan053@gmail.com